**ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගම - 2018**
**-------------------------------------------------**

## 1.1 මතය වියාචනය
**------------------**

ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගමේ ("සමාගම") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

## 1.2 මතය වියාචනය සඳහා පදනම
**----------------------------------**

(i) සමාගම විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. 2018 ජනවාරි 01 දිනට සමාගම සතුව තිබූ රු.8,290,423 ක් වූ ස්ථාවර වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. තවද 2016 වර්ෂයේ සිට මිලදී ගන්නා ලද රු.9,290,003 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රධාන ලෙජරයේ වත්කම්වල ස්වභාවය අනුව වර්ග නොකර මුළු වටිනාකම ප්‍රාග්ධන උපකරණ ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ii) සමාගම විසින් 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය වෙනුවෙන් භෞතික තොග සත්‍යාපනයක් සිදුකර නොතිබුණි. විකල්ප ක්‍රම අනුගමනය කිරීම තුලින්ද විගණනයට එදිනට පැවති රු.38,470,575 ක තොගයේ නිවැරදිතාවය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි විය.

(iii) සමාගම විසින් ආදායම් බදු, ජාතිය ගොඩනැගීමේ බදු සහ එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී නොමැති බව නිරීක්ෂණය විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ  වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනා ලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| වර්ෂය තුළ ස්ථාවර තැන්පතු වල ආයෝජනය රු.2000,000 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාම් ලෙස රු.3,641,432 ක් දක්වා තිබුණි. ඒ අනුව ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාම් රු.1,641,432 ක් වැඩියෙන් දක්වා තිබුණි. තවද මුදලින් නොලද පොලී ආදායම වූ රු.360,973 මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් ලැබීම් ලෙස ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | මෙම වැරදි ගිණුම් ක්‍රමය නැවත නිවැරදි කර ගිණුම් ප්‍රකාශන ලබාදීඇත. | පිළිතුර පිළිගත නොහැක. අදාළ ගිණුම්කරණ දෝෂ නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමු | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| 1988 අංක 56 දරන සහ 2000 අංක 53 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 (අ) වගන්තිය | වාහන සේවා කටයුතු සිදුකරන ආයතන විසින් ඊට අදාලව බලපත්‍රයක් ලබාගත යුතු වුවද, සමාගම 2019 නොවැම්බර් 22 විගණිත දින වන විටද එම බලපත්‍ර ලබා ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අදාල පාරිසරික පනත්වල අවශ්‍යතාවයන් ඉටුවන ආකාරයට කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.23,778,392 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.14,677,560 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,100,832 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. මෙම වැඩිවීමට බස් රථ අලුත්වැඩියා ආදායම රු.38,012,938 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාගම ඒකල, ජාඇල පිහිටි අක්කර 23 ක් පමණ වූ භූමි ප්‍රදේශයක පවත්වාගෙන යන අතර එහි අයිතිය සමාගම සතුව නොමැති අතර දේපල හිමිකරු සමග බදු ගිවිසුමකට හෝ වෙනත් නීතිමය ගිවිසුමකට සමාගම එළඹ නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරමි. | දේපල සම්බන්ධයෙන් නීත්‍යානුකූල තත්වයන් ඇති කිරීමට වගබලාගත යුතුය. |
| (ii) | බස් රථයක් අලුත්වැඩියා සඳහා පැමිණි පසු ඒ සඳහා සම්පූර්ණ ඇස්තමේන්තුවක් සකස් කර කාර්ය අතරතුර හා කාර්ය අවසන් වීමෙන් පසු විචලනයන් පරීක්ෂා කළ යුතු වුවද ඉංජිනේරු අංශය විසින් 2018 වර්ෂයෙහි අදාල ඇස්තමේන්තු සකස් කිරීම හා විචලනයන් පරීක්ෂා කිරීම සිදු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරමි. | ප්‍රසම්පාදනයන් ක්‍රමවත්ව සිදුවන බවට කළමනාකරණය වගබලාගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ මූලා ප්‍රකාශන තුලට විකුණුම් පිරිවැය හා ආදායම් ලෙස පිළිවෙලින් රුපියල් මිලියන 77.96ක් හා රුපියල් මිලියන 128.74ක් ලෙස ගෙන ඇති අතර, එහි කාර්යසාධන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) අලුත්වැඩියා සඳහා සමාගම බස් රථ රැගෙන ඒමෙන් පසු ඉංජිනේරු අංශයෙහි ඒ පිළිබඳව විධිමත් ලේඛනයක් නඩත්තු කල යුතු වුවද, එසේ විධිමත් ලේඛනයක් නඩත්තු නොකරන බව නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් 2018 වර්ෂයේ අලුත්වැඩියා කල බස් රථ සඳහා ගතකළ කාලය, අලුත්වැඩියාව නිම කල දිනය, එක් එක් අංශයෙහි බස් රථය කොපමණ කාලයක් තිබුණේද යන්න විගණනයට තහවුරු කර ගත නොහැකි වූ අතර ඒ සම්බන්ධ අභ්‍යන්තර පාලනයන් දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරමි. | අදාල කාර්යන්වල කාලයන් නිසි පරිදි කළමනාකරණය කල යුතුය. |
| (ii) බස් රථ අලුත්වැඩියා කටයුතු සඳහා 2018 වර්ෂයේ කොන්ත්‍රාත් ආයතන 12 ක් සමාගමෙහි ලියාපදිංචි වී තිබුණු අතර එම ආයතන වල පලපුරුද්ද තීරණය කෙරෙන සමාජිකයින් ගණන හා ඔවුන් අදාල වන කෙෂ්ත්‍ර ලෙසද විගණනයට තහවුරු කර ගැනීමට නොහැකි වුණි. එසේම 2018 වර්ෂයේදී බස් රථ අලුත්වැඩියා සඳහා කිසිදු ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය කිරීමෙන් තොරව කොන්ත්‍රාත්කරුවන් වෙත රු.මිලියන 4.82 ක මුදලක් ගෙවා තිබුණි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරමි. | නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නිවැරදි ලෙස ශ්‍රම කොන්ත්‍රාත් ලබාදීම් කළමනාකරණය කල යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| නීතී, රීති, රෙගුලාසි ආදියට යොමුව | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ | | |

| | | | |
|---|---|---|---|
| (i) | 3.2 වගන්තිය අනුව සමාලෝචිත වර්ෂය තුලදී බස් රථ අළුත්වැඩියා කටයුතු සඳහා රු.9,104,750 ක් වටිනා ඇලුමිනියම් තහඩු පුද්ගලික සමාගමක් වෙතින් මිළදී ගෙන ඇති අතර ඒ සඳහා ජාතික වශයෙන් තරඟකාරී ලංසු කැඳවා මිළ ගණන් ඇගයීමෙන් තොරව මිළදී ගෙන තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | මිලදී ගැනීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ප්‍රතිපාදන අනුව මිලදී ගැනීමට කටයුතු කල යුතුය. |
| (ii) | 3.4.3 වගන්තිය අනුව දැන්වීම් පල කිරීම ආර්ථික වශයෙන් අවාසි සහගත වන අඩු වටිනාකමින් යුතු අයිතමයන් ප්‍රසම්පාදනය කිරීම සඳහා හෝ නිතර භාවිතා වන එක් එක් අයිතමයන් මිළදී ගැනීම සඳහා අයදුම්කරුවන් ලියාපදිංචි කිරීම සිදු කර එසේ භාණ්ඩ හා සේවා සැපයීමට හැකි සැපයුම්කරුවන්ගේ නම් ඇතුලත් ලැයිස්තුවක් පිළියෙල කරනු ලැබිය යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | සැපයුම්කරුවන් වාර්ෂිකව ලියාපදිංචි කිරීමට කටයුතු කල යුතුය. |
| (iii) | 4.2 වගන්තිය අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාල සටහනක් පිළියල කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | ප්‍රසම්පාදන සැලැස්ම හා කාල සටහන වාර්ෂිකව සකස් කර අනුමත කරවා ක්‍රියාත්මක කිරීමට වගබලාගත යුතුය. |

**4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**
**------------------------------------------**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ මාස 08 ක් හා දින 20 ප්‍රමාද වි 2019 නොවැම්බර් 18 දිනදී ය. | පිළිතුරු ලබා දී නොමැත | මූල්‍ය ප්‍රකාශන අදාල චක්‍රලේඛවල ප්‍රතිපාදනවලට අනුව නියමිත දිනට විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |